**2019 ජූලි මස 15 වන දින සිට 2019 ජූලි මස 21 වන දින දක්වා**
**ප්‍රශංසා එකතු සුපුවත**
**පුරාණ ගිවිසුමේ ජනතාවට දෙවියන් වහන්සේ දානය කළ**
**පිතෘක මාතෘක ආදරය**

01. ආරම්භක ගීය : පුබුදු ගී 118 "මේ ලෝ තලේ...."

02. ප්‍රශංසාවට යොමුව :

* දෙවියන් වහන්සේ කිසිවෙකුට, කිසිවකට සමකල නොහැකි අසමසම තැනැන් වහන්සේ ය. ඔවුන් වහන්සේ එසේ සම කළ නොහැක්කේ සියල්ලේ මැවුම්කරුවාණන් දෙවියන් වහන්සේම වන බැවිනි. දෙවියන් වහන්සේ වෙනස් ය. ඒ වෙනස් බව මිනිස් මනසකින් වටහා ගත නොහැක. සිය ඒකජාත පුත්‍රයාණන්ව ජොර්දාන් නදියේදී 'ප්‍රසන්න පුතා' ලෙස භාර ගෙන සිය පුතුගේ සිරුර කුරුසියක් මත යාගයක් කොට පුදකිරීම පියෙක් පුතෙකුට එලෙසින් සිදුවීමට හැරීම මිනිස් මනසකින් කෙලෙස වටහා ගන්නද? ඒ දෙවියන් වහන්සේ ය.
* පාස්කු ඉරුදින සිදුවූ බේදවාචකය දෙවියන් වහන්සේ වෙන්නට ඉඩ හල සේක. එවැන්නක් එලෙසින් එවන් දිනක සිදුවූයේ මන්දැයි ඔවුන් වහන්සේගෙන් අපට ප්‍රශ්න කළ නොහැක. ප්‍රේමය වූ දෙවියන් වහන්සේ ඒ සිදුවීම් තුළ ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත ඉටුවන්නට ඉඩහල සේක. එය දේව සිතයි. දේව ක්‍රියාකාරිත්වයයි. **"නුඹලාගේ යෝජනා මාගේ යෝජනා නොවේ; නුඹලාගේ සිතුවිලි මාගේ සිතුවිලි නොවේ."**
* එවන් මහා බලපරාක්‍රමයේ දෙව් මහෝත්තමයාණන්ගේ දේව දරුවෙක් වීමේ අප ලබා ඇති වරම කොතරම් අගනේද? එවන් අගයක්, වටිනාකමක් අපට දුන් අබ්බා තාත්තා / අබ්බා අම්මා පසසමු. නමදිමු.
* පුබුදු ගී අංක 42 "අහස පොළොව අතර රැඳි...." ගීය සමගින් ගැඹුරු ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

03. දවසේ සුපුවත :

* මිහිමත වැඩෙන අති විශාල ගසක් වුවද, පසට පෑගී යන කුඩා පැලයක් වුව ද එළදැරීමට අප හඳුන්වන පරිදි ස්ත්‍රී හා පුරුෂ පරාග සංකලනයක් අත්‍යවශ්‍ය වේ. සත්ව ලෝකයේද කුඩාම සතාගේ සිට අලි ඇතුන් වැනි දැවැන්තයින් දක්වාම ඔවුන්ගේ පැවැත්ම රැඳී ඇත්තේ ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශවයේ එක්වීම තුළිනි. ඒ විශ්වයේ මැවුම්කරුවාණන්ගේ නියමයයි. ශුද්ධවූ කැමැත්තයි. **"එය මනහර බව දෙවියන් වහන්සේ දුටු සේක."**

* මිනිසා මැවීමේදී දෙවියන් වහන්සේ මිනිස් මැවිල්ල තුළට ඇතුළත් කළේ සිය දේව ස්වරූපයයි. ඒ ස්වරූපය පිතෘක - මාතෘක ස්වරූපයයි. පළමු මිනිසාගේ පියා මෙන්ම මවද වෙමින් දේව ස්වරූපයේ පිතෘක - මාතෘක ලක්ෂණ ඒ මැවිල්ල තුළ අන්තර්ගත කළ සේක. සිය ස්වරූපයට මැවූ මිනිසා තුළ පිළිවෙල හා බලය ද, ස්ත්‍රිය තුළ සුන්දරත්වය හා අභිරහස්මක බව අන්තර්ගත වූයේ එලෙසිනි.

* සිය ආත්මාර්ථය තුළින් දේව පුත්‍රභාවය නැතිකර ගත් මිනිසා මැවුම්කරුවාණන් වූ පියාණන් වහන්සේ ගැන වටහා ගනු ලැබුවේ වැරදි සහගත අයුරිනි. ප්‍රේමය වූ දේව තාත්තාව වහා කිපෙන, භයානක, පළි ගන්න සුළු, දඬුවම් කිරීමට බලා සිටින දෙව් කෙනෙකකු ලෙස හඳුනා ගත් නමුත්, මිනිසා තනිව ඈත්ව ගමන් කිරීමේදී ඇද වැටෙන විට, කරදර වලට මුහුණ දෙන විට ඔහුට සහය වීමට දෙවියන් වහන්සේ ඔහු සොයා විත් පියෙකු - මවෙකු ලෙස ලුහුබඳින ප්‍රේමයකින් ප්‍රේම කරන තැනැන් වහන්සේ ලෙස හඳුන්වා දෙන සේක.

* පිටුපා ගිය සිය දරුවන් තමන් වහන්සේට පිටු පා දුක්විඳින කල තමන් වහන්සේගේ පිතෘක - මාතෘක ප්‍රේමය ඔවුනට වටහා දීමට විවිධ පණිවුඩකරුවන්, දිවැසිවරුන් ඔවුන් අතරට එවමින් සිය ආදරය වටහා දී ඔවුන් නිසිමග ගැන්වීමට වෙර දරණ අයුරු හොසියා,යෙසායා වැනි දිවැසිවරුන්ගේ වදන් වලින් පැහැදිලිය.

  i හොසියා 11:1-4 ii යෙසායා 66:7-13 iii යෙසායා 40:11 යන කොටස් තුළින් පැරණි ගිවිසුමේ ජනතාව දෙවියන් වහන්සේ ප්‍රකාශ කළ පිතෘක - මාතෘක ප්‍රේමය අත්දකින්න.

* ඔවුනට ඉතා පැහැදිලි අත්දැකීම් ගෙනහැර පාමින් සිය ආදරය ප්‍රකාශ කරන සේක.
  යෙසායා 49:15 "මවකට හැකිවෙද අමතක කරනට...."
  පුරාණ ගිවිසුමේ ජනතාවට දෙවියන් වහන්සේ දැක්වූ පිතෘක මාතෘක ආදරය ඔබ අත්දකින අයුරු සාංඝික කරන්න.

04. සතිය පුරා :

* මෙලොව කිසිවෙකුට මා අගයක් නොමැති අයෙක් වුවද, මැවුම්කරුවාණන්ට මා ඉතා වටිනා කෙනෙකි. දවස පුරා මගේ නම සිය අත්ලේ කොටා ගෙන සිහි කිරීමට තරම් වටිනා කෙනෙකි. මෙය සත්‍යයකි. එය අපගේ ජීවිතවලට ඇතුලාන්තයට දැනෙන අයුරින් අයිති කර ගනිමු.

* කිසිදා කිසි විටෙක මා තනි නොවන බවත් ප්‍රායෝගිකව අත්දකින්න උත්සාහ කරමු. ඒ වෙනුවෙන් යදිමු.

05. අවසන් ප්‍රශංසාව :

පුබුදු ගී අංක 376 (නව පරිවර්ථනය) 364 (පැරණි පරිවර්ථනය)
"අයිති කර ගනිම් මට දුන් ...."

===========================

## 2019 ජූලි මස 22 වන දින සිට 2019 ජූලි මස 28 වන දින දක්වා ප්‍රශංසා එකතු සුපුවත

**"ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළ අත් දුටු දේව මාතෘත්වය හා පීතෘත්වය. "**

01. ප්‍රශංසාවට හැඳින්වීම :

* ජේසුස් වහන්සේ 12 වයසේ දී දේව මන්දිරය තුළ දී දින 3ක් නැතිවී සිට නැවත සම්බ වූ අවස්ථාවේ ස්වකීය දෙමව්පියන්හට ඔවුන් වහන්සේ දුන් පිළිතුර වූ "ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නහු ද?" යන ප්‍රකාශය ජේසු කුමරාගේ අභ්‍යන්තරික අත්දැකීම ප්‍රකාශ කරනු ලබයි. ඔවුන් වහන්සේ **දෙවි පියාණන් වෙතින් අත්විඳි පීතෘක මාතෘක ආදරය** නිසා ඔවුන්වහන්සේට ගෙදර අමතක වූවා සේය.
* සමිඳාණෝ වයස අවුරුදු 30 දී ප්‍රසිද්ධ ජීවිතය අරඹමින් ජෝර්දාන් නදියේ දී, ස්නාවක ජොහාන් වෙතින් බෞතීස්ම ස්නාපනය ලබා දියෙන් ගොඩ නැගෙත්ම ස්වර්ගයෙන් නික්මුණු "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය; ඔබ කෙරේ ඉතා ප්‍රසන්න වී සිටිමි" යන අනාවරණය ලබමින් ඒ තුළ **දෙවි පියාණන් වෙතින් අත්විඳි පීතෘක මාතෘක සෙනෙහසින් පිරී** ශුද්ධාත්ම මෙහෙයවීමට නතුව, පාළුකරයේදී ඒ අත්දැකීම වඩාත් තහවුරු කර ගනිමින්. දේව රාජ්‍යය වෙනුවෙන් පූර්ණව දිවි ගෙවීම අරඹන සේක.
* ඉහත අවස්ථාවන්හිදී ජේසු සමිඳුන් අත්දුටු ඒ පූර්ණ ආදරයට මේ දැන් අප හදවත් විවෘත කරමු. අපද ඒ ශුද්ධවූ ආදරයෙන් පිරී ශුද්ධාත්ම මෙහෙයවීමට නතු වී. ඔවුන් වහන්සේට පිදිය හැකි උතුම්ම ස්තුතිය, ප්‍රශංසාව, වන්දනාව හා නමස්කාරය පුදදෙමු.
* පුබුදු ගී අංක 01 "පිය පුත් සුදතුම්......." ගීය සමඟින් ශුද්ධාත්ම දීමනා වරම් අත්දකින ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

02. පසුගිය සතිය තුළ අපට ලැබුණු ප්‍රශංසා එකතු සුපුවත පිළිබඳව අවදි වී අත්දැකීම් බෙදා ගනිමු.

03. දවසේ සුපුවත : (කුඩා සංඝ ලෙස පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ පිළිබඳව බෙදා ගන්න.)

* ශු. මාක් 1:12-13 ජේසු සමිඳාණෝ පාළුකරයේ දී පීතෘක ආදරය අත්දකිමින් ගැඹුරු සුරක්ෂිත භාවයක් අත්දුටු ආකාරයත් මාතෘක ආදරය අත්දකිමින් (යෙසායා 66:12,13) ගැඹුරු සෙනෙහසක් අත්දුටු ආකාරය පිළිබඳවත් සාංඝික කර ගන්න.

* ශු. මතෙව් 6:9-13 "ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණෙනි" යනුවෙන් අමතන විට එම සම්පූර්ණ යාච්ඤාවට පදයෙන් පදය අවදි වෙමින් ඒ තුළ අබ්බා අම්මා වන දෙවි මහෝත්තමයාණන්ගේ පීතෘක මාතෘක ආදරයට අපව ඇතුළු කරගන්නා ආකාරය පිළිබඳව සාංඝික කර ගන්න. (උදා: අපගේ දිනපතා භෝජනය මාතෘක ආදරය අත්දැකීමක් ලෙස)

* ශු. මතෙව් 20:1-15 මෙම උපමා කතාවේ දී අබ්බා පියාණන් වහන්සේ පීතෘක ආදරය. මාතෘක ආදරය ප්‍රකාශ කරමින්, උපමාව තුළ රිදී කාසියේ කුලිය සේවකයන් සියල්ලන්ටම එක සමානව ලබා දීමට යොමු වන්නේ, පවුලක දෙමාපියන් සෑම දරුවකුටම එක හා සමානව ආදරේ කරන ආකාරයටය. මේ පිළිබඳව ක්‍රිස්තුන් වහන්සේගේ අත්දැකීම පිළිබඳව සාංඝික කර ගන්න.

* ශු. මාක් 6:30-44 මෙහි දී ඔවුන් වහන්සේගේ පීතෘක-මාතෘක ආදරය ප්‍රකාශ වන අයුරු බෙදා ගන්න. "ඔවුන් වහන්සේ මහා පිරිසක් දැක එඬේරකු නැති බැටළුවන් වැනි වූ ඔවුන්ට අනුකම්පා කොට ..." (ශු. මාක් 6:34) මෙහි දැක්වෙන 'අනුකම්පා කොට' යන වදන වෙනුවට යොදා ඇති "ස්ප්ලග්ක්නිසොමායි" යන හෙබ්‍රෙව් වදනේ අර්ථය වන්නේ යටිබඩ යන්නය. 'කරුණා දයාව' යන්න වෙනුවට ද හෙබ්‍රෙව් වරුන් භාවිතා කළ එම වචනයේ අර්ථය "රකාමිම්" යන වචනයේ අර්ථයට සමානය. තවද මෙහි ජේසු සමිඳාණෝ "ඔබම ඔවුන්ට කෑම දෙන්නැ" යි වදාරන සේක.... මෙම සිදු වීම තුළ ප්‍රකාශ වන මාතෘක ආදරය පිළිබඳව සාංඝික කර ගන්න.

04. අපගේ පුත්‍රභාවය :

i ඉහත සුවිශේෂ සිද්ධි තුළ ප්‍රකාශ වන්නේ ජේසු සමිඳුන් ඔවුන් වහන්සේගේ දිවිය පුරා අත්දුටු දෙවියන් වහන්සේ මගේ තාත්තා අම්මා කියන අත්දැකීමේ ගැඹුරයි. ඒ සියල්ල තුළ අබ්බා අම්මාගේ ආභාෂය, අබ්බා අම්මාගේ සිත, අබ්බා අම්මාගේ දෙනෙත, අබ්බා අම්මාගේ දෙසවන, අබ්බා අම්මාගේ හදවත පමණක් නොව පූර්ණවම ඔවුන් වහන්සේව අයිතිකර ගත් සේක. ඔවුන් වහන්සේ අබ්බා අම්මාට පූර්ණවම අයිති වූ සේක.

ii ඒ තෑග්ග ඔබටත් මටත් අයිතියි. අබ්බා අම්මා යන වදන් අපගේ මුවින්, අපගේ දෙතොලින්, අපගේ දිවෙන් අපි නිර්මාණය කර පිටකරන වචන කිහිපයක් නොව, අබ්බා අම්මා යන අනාවරණය මගේ පරම අත්දැකීම විය යුතුය. ඒ නිසා අපි හැකි හැම අවස්ථාවකදීම විශේෂයෙන් මගේ පැයේ දී සුළු වෙලාවක් හෝ ගත කර, මේ අත්දැකීමට ඇතුළු වීමට පියවර ගනිමු. (සාකච්ඡා කර තීරණ ගන්නට යොමු වෙමු.)

05. අප දෙසට : (කුඩා සංඝ ලෙස සාංඝික කර ගනිමු)

* එදිනෙදා ජීවිත සිද්ධීන් තුළ ඔබගේ පිළිතුරු දීම කොතෙක් දුරට දේව පුතෙක් දුවක් ලෙසටද?

* යාච්ඤා ජීවිතය පිළිබඳ අත්දැකීම බෙදා ගනිමු විශේෂයෙන් මගේ පැය. නිරන්තර ශුද්ධාත්මයාණන්ට අවදි වීම පිළිබඳව ඔබගේ අත්දැකීම්, ඔබගේ තීරණ බෙදා ගන්න.

* ප්‍රශංසා එකතුව, ප්‍රශංසා ගම, ශ්‍රාවක සංඝය තුළ මගෙන් (ඔබගෙන්) දායත්වය ලැබිය යුතු සේවාවක් යම් වගකීමක් තිබෙනවාද? ඒ ගැන ඔබ අවදි වෙලා තිබෙනවාද? එය ඉටු කරන්නට අවශ්‍ය නොවන්නේද? දැන්ම අදම තීරණයක් ගන්න. (දේව වචන ව්‍යාප්තිය, ක්‍රිස්තුදාන සේවාව, ජුසේ වාස් පිය මෙහෙවර, බැහැදැකීමේ සේවාව, ගෘහ යාච්ඤාව, මැදිහත් යාච්ඤාව, ගායන-වාදන සේවාව, ළමා අංශය, තරුණ-තරුණි අංශ .... පිළිබඳව)

06. අවසන් ප්‍රශංසාව :

පුතේ // පුතුනි මගේ මට ඇසේ ආදරේ හඬ ඔබේ පිපාසය ඔබේ මට දැනේ //

අබ්බා අබ්බා පියාණෙනි /// අබ්බා අපේ පියාණෙනි

අබ්බා අබ්බා පියාණෙනි /// අබ්බා මගේ පියාණෙනි

අබ්බා අබ්බා මෑණියනි /// අබ්බා අපේ මෑණියනි

අබ්බා අබ්බා මෑණියනි /// අබ්බා මගේ මෑණියනි

==============================

## 2019 ජූලි මස 29 වන දින සිට 2019 අගෝස්තු මස 03 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

### ජේසු සමිඳාණන්ගේ ජීවිතය තුළ අත්දුටු පිතෘක මාතෘක ආදරය

01. ආරම්භක ගීය : පුබුදු ගී අංක 07 "සුදත් සුරිඳුනේ...."

02. ප්‍රශංසාවට යොමුව :

* ඔබ කව්ද? ඔබ ආවේ කොහේ සිටද? යන්නේ කොතැනටද? ඔබගේ ජීවිතය ගැන ඔබට ඇති අවබෝධය තව කෙනෙකු සමඟ සාංඝික කර ගන්න.

* ලෝකයා ඔබ මොන අයුරින් සැලකුවද, ඔබ ගැන ඔබටම කිසියම් ස්ථිර බවක් නොතිබුණද, ලෝකයේ සැමට වඩා ඔබට ආදරය කරන කෙනෙක් සිටින බව පසුගිය සතිය තුළදී අපි අත්දුටුවා.ඔබ මොන විදියේ දේහ ලක්ෂණ දැරුවද, අන් අයට ප්‍රිය මනාප නොවූවද, ඔවුන් වහන්සේට ඉතාම වටිනා කෙනා ඔබයි.

* මුළු ලොවම එදිරිවී මුවකට හරවා මා එපා කලත් මට අගයක් දෙන, මා නිදි යහනේ සිටියදී මා නිසා නොනිදා පහන් කරන දෙවියන් වහන්සේට කෙලෙසින් කළගුණ සළකන්නද? අපට කළහැකි එකම දෙය ඔවුන් වහන්සේ පසසමින්, නමස්කාර කරමින් තුති ප්‍රශංසාවට ඇතුළු වෙමු.

* පුබුදු ගී අංක 146 "අභිරහසක් කරදා ...." ගීය සමගින් ප්‍රශංසාවට ඇතුළු වෙමු.

03. සතියේ සුපුවත :

* ජෝර්දාන් නදිය තුළදී ලදදේව පුත්‍රභාවයේ අනන්‍යතාවය කිසිදා කිසිවකු ඉදිරියේ බියාදුවන, හෑල්ලුවන අනන්‍යතාවයක් නොවේ. ජුදා පාලකයින් ජේසු සමිඳුන්ව 'වඩුවාගේ පුතා' ලෙස හඳුන්වා දීමට කොතෙකුත් උත්සාහ කලද ඔවුන් වහන්සේ තුළ වූ සැබෑ අනන්‍යතාවය කිසිවකට යටපත් කළ නොහැකි විය.

* රටේ පාලකයාවූ තමන් වහන්සේව මරණින් ගැළවීමට, නිදහස් කර යැවීමට බලය ලත් පිලාත් ඉදිරියේදී ඒ අනන්‍යතාවය ප්‍රකාශ කළේ ඔහුටද අභියෝගයක් වන ලෙසිනි. එවිට පිලාත් 'එසේ නම් නුඹ රජෙක්දැ'යි ඔවුන් වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "මම රජෙක් යයි ඔබම කියන්නෙහිය" (ශු.ජොහාන් 18:37)

* නපුරා පාළුකරයේදී දීර්ඝ කාලයක් උත්සාහ ගනු ලැබුවේ ජේසු සමිඳුන් අත්දුටු ඒ දේව පුත්‍රභාවය ඔවුන් වහන්සේ ලවා පරීක්ෂාවට පත් කිරීමට ය. කොපමණ බාහිර දුෂ්කරතා හමුවේ වුවද ඒ පාළුකරයේ බියකරු තත්ත්වය හමුවේදී පියාණන් වහන්සේට නතුවීම තුළ "පුතුනි මගේ පුතුනි මගේ " යන හඬට හිමිකරු වෙමින් කිසිදු පැකිලීමකින් තොරව එතෙක් පැවති ලෝක පැවැත්ම කනපිට පෙරලන සේක.

* නාමය උච්චාරණය කිරීමට පවා බියවූ ජනතාවට දෙවියන් වහන්සේ කොපමණ ප්‍රේමබරිත පිතෘක - මාතෘක ආදරයෙන් පිරි දෙවියන් වහන්සේ ද යන වග ඉගැන්වීමට යොදා ගත් නිදසුන් වලින් පැහැදිලි ය.

  - ශු.මතෙව් 20:1-15 මිදිවත්තේ සේවකයින්ට වේතන ගෙවීම
  - ශු.මාක් 6:30-44 පන්දහසකට කන්න දීම
  - ශු.මාක් 6:34 එඬේරා හා බටැළු පැටවුන්
  - ශු.ලූක් 15:11-32 නාස්තිකාර පුත්‍රයා භාර ගැනීම

  මෙම බයිබල් කොටස් තුළින් සමිඳුන් අත්දුටු පියාණන් වහන්සේගේ පිතෘක - මාතෘක ආදරය සාංඝික කර ගන්න.

04. සතිය පුරා :

* මම දේව පුතෙක්මි. දෙවියන් වහන්සේ මාගේ පියාණන් වහන්සේ ය. මෙය මාගේ ජීවිතයට සත්‍යයක් ද? එය අප ජීවිත වලට යථාර්ථයක් කර ගනිමු.

* ඒ සඳහා වරම් පතා යාච්ඤා කරමු. හැකි සෑම විටම දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් හමුවට ගමන් කරමු.

05. අවසන් ප්‍රශංසාව :

පුබුදු ගී අංක 160 "ඔසොවා යන සේ පැටවුන් ...."

********************